# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,470 - 2025 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1540 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1541 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 02 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1159- B 082732 — 5,403 (2025/10)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයි

### මහා නගර සභාව

ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසැල් ව්‍යාපෘතිය සඳහා ගුරුවරුන් බඳවා ගැනීම

**2025.12.19 දිනැති අංක 2469 ගැසට් පත්‍රයේ 12-320 නිවේදනයේ ප්‍රධාන පෙර පාසල් ගුරු තනතුර හා සහායක පෙර පාසල් ගුරු තනතුර යන තනතුරු දෙකෙහිම අංක 4 අධ්‍යාපන සුදුසුකම් සහිත තීරුව පහත පරිදි සංශෝධනය කරමි.**

4. අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02 (දෙකකට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 (හයකින්) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

* අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් එලෙසින් ම පවතී.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

12-652

---

### වලපනේ ප්‍රාදේශීය සභාව

වලපනේ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සේවකයින් දෙදෙනෙකු (02) සහ වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා සේවකයින් දෙදෙනෙකු (02) (ප්‍රාථමික ශිල්පීය නොවන සේවය ) (මාස 06 කට) දෛනික වැටුප් මත සේවයේ යෙදවීම

වලපනේ ප්‍රාදේශීය සභාවේ පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට අදාළව සේවයේ යෙදවීමට වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| සෞඛ්‍ය කම්කරු (දෛනික) | 02 |
| වැඩ / ක්ෂේත්‍ර කම්කරු (දෛනික) | 02 |

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ව්‍යවස්ථාව අනුව සුදුසුකම් :

01.1 ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)\

01.2 සුදුසුකම් :

01.2.1 අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය සහ කාර්යය | | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | අනුයුක්ත කරන ස්ථානය | කාර්යය | |
| 01 | සෞඛ්‍ය කම්කරු (දෛනික) | 02 | රාගල | මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහ ඉරි ඇඳීමට සහාය වීම, තාර දැමීම, ප්‍රිමික්ස් සැකසීමට අත්උදව් දීම, මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම,ගලි යන්ත්‍රයේ කාර්යයන් ,කසල එකතු කර ට්‍රැක්ටර්වලට දැමීම, පොදු වැසිකිලි හා කැසිකිලි පවිත්‍ර කිරීමේ කාර්යයන් ඇතුළුව පිරිසිදු කිරීමේ කාර්යයන් | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවල 5 ශ්‍රේණිය සමත් අයවළුන් සේවයේ යෙදවීමට කටයුතු කරනු ලැබේ. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු (දෛනික) | 02 | පදියපැලැල්ල සහ උඩුපුස්සැල්ලාව | | |

01.2.2 කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රිකාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) අවම උස අඩි 05 අඟල් 02 ½ ක් විය යුතුය.

01.2.3 වෙනත්:

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.
III. අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

01.3 වයස:

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18 යි

01.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 45 යි

01.4 බඳවා ගැනීමේ ක්‍රමය:

බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

01.5 අයදුම් කළ යුතු ආකාරය:

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12' x 8' ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර "වලපනේ ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු (දෛනික වැටුප් මත) / වැඩ/ක්ෂේත්‍ර කම්කරු (දෛනික වැටුප් මත) පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත සේවයේ යෙදවීම " ලෙස අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2026.01.16 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, වලපනේ

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත්
3. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය
5. පොලිස් වාර්තාව

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වලපනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

මෙම නිවේදනය සිංහල, දෙමළ අනුවාදනයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනය අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 19 දින,
වලපනේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**වලපනේ ප්‍රාදේශීය සභාවේ ................................................ සෞඛ්‍ය කම්කරු (දෛනික වැටුප් මත) / වැඩ/ක්ෂේත්‍ර කම්කරු (දෛනික වැටුප් මත) මාස 06 ක් සේවයේ යෙදීම සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය**

1. මුලකුරු සමඟ නම :…………………………………………………………………………
2. සම්පූර්ණ නම :……………………………………………………………………………
3. ජාතික හැඳුනුම්පත් අංකය:………………………………..
4. උපන් දිනය: වර්ෂය:………………. මාසය :………… දිනය :…………….
5. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : අවුරුදු:……………. මාස:………… දින:……………….
6. ස්ත්‍රී / පුරුෂ භාවය :……………………..
7. විවාහක / අවිවාහක බව :………………..
8. ජාතිය :………………
9. ස්ථිර ලිපිනය:……………………………………………………………………..
10. දුරකථන අංකය :…………………………….
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? ලියාපදිංචියෙන් ද ? යන බව:…………………………
12. අධ්‍යාපන සුදුසුකම්:

අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

| පළමු වතාව | දෙවන වතාව |
|---|---|
| වර්ෂය හා මාසය :……………. | වර්ෂය හා මාසය :……………. |
| විභාග අංකය :……………. | විභාග අංකය :……………. |

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 1. | |
| 2. | | 2. | |
| 3. | | 3. | |
| 4. | | 4. | |
| 5. | | 5. | |
| 6. | | 6. | |
| 7. | | 7. | |
| 8. | | 8. | |
| 9. | | 9. | |
| 10 | | 10 | |

13. වෘත්තීය සුදුසුකම් :…………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………

14. පළපුරුද්ද : ……………………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………………

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිව දන්වමි.

……………………..
අයදුම්කරුගේ අත්සන.

දිනය:………………….

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ස්ථිර / තාවකාලික / අනියම් / ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කල හැකි / නොහැකි බව කාරුණිකව දන්වමි.

................................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:……………….

12-637

# පළාත් පාලන නිවේදන

## ගම්පොළ නගර සභාව

### වරිපනම් බද්ද - 2026 වර්ෂය

ගම්පොල නගර සභාව විසින් 2025 නොවැම්බර් මස 11 දින පවත්වන ලද මාසික මහ සභාවේ තීරණ අංක 01.01 පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් 2026 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30 සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනයන් වලින් අවසන්වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 04 කින් නගර සභා කාර්යාලට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2026 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ ප්‍රමාණයෙන් (10%) සියයට දහයක වට්ටමක් ද, එක් එක් කාර්තුවේ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එම්. එම්. පී. ඉරුක මිහිරාන් වීරරත්න,
සභාපති,
ගම්පොළ නගර සභාව.

2025 නොවැම්බර් මස දින,
ගම්පොල නගර සභා ශාලාවේ දී ය.

**යෝජනාව**

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 166 වගන්තිය සමග කියවිය යුතු මහානගර සභා ආඥාපනතේ 238(1) උපවගන්තිය යටතේ ගම්පොල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ගම්පොල නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2025 වර්ෂය සඳහා වූ තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී තක්සේරුව මත නගර සභා ආඥාපනතේ 160(1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගම්පොළ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පැරණි නගර සභා සීමාව තුළ පිහිටි නේවාසික ස්ථානවලින් 7% ක වරිපනම් බද්දක් ද, වාණිජ දේපළ ස්ථානන වලින් 11% ක වරිපනමක් ද, නේවාසික හෝ වානිජ නොවන ස්ථානවලින් 12%ක වරිපනම් බද්දක් ද, අය කිරීමටත් නගර සභාවට අලුතින් එකතු වූ ප්‍රදේශවලින් නේවාසික ස්ථානවලින් 5% ක වරිපනම් බද්දක් ද, වානිජ ස්ථානවලින් 9% වරිපනමක් ද, නේවාසික හෝ වානිජ නොවන ස්ථානවලින් 12% ක වරිපනම් බද්දක් ද පනවා අය කිරීමටත්, එකී වරිපනම් බද්ද 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 4 තුළ දී සමාන වාරික 4 න් නගර සභාවට ගෙවිය යුතු යැයි විධානය කිරීමට නගර සභාව යෝජනා කරන්නීය.

නගර සභාවට අලුතින් එකතු වූ ප්‍රදේශ නාමලේඛනය

| *පාර/වීථිය/මාවත* | *වරිපනම් අංක* |
|---|---|
| කොට්ඨාස අංක 01 | |
| බෝමළුව පාර වම | 03-67/8 |
| බෝමළුව පාර දකුණ | 04-50/1 |
| ආරාමය පාර වම | 09-111 |
| ආරාමය පාර දකුණ | 08-102 |

| *පාර/වීථිය/මාවත* | *වරිපනම් අංක* |
|---|---|
| බැබිල පාර දකුණ | 40/4-98 |
| බෝවල පාර වම | 01-205 |
| බෝවල පාර දකුණ | 08-262 |
| දොඹගස්පිටිය පාර වම | 03-33 |
| දොඹගස්පිටිය පාර දකුණ | 06-262 |
| ඇල්පිටිය පාර වම | 99-215/8 |
| ඇල්පිටිය පාර දකුණ | 09-210 |
| ඇල්පිටිය (MOSQUE) වම | 05-233/10 |
| ඇල්පිටිය (MOSQUE) දකුණ | 20-216 |
| ගංහත පාර වම | 01-175/110 |
| ගංහත පාර දකුණ | 02-162/20 |
| කහටපිටිය විලේජ් පාර වම | 01/133 |
| කහටපිටිය විලේජ් පාර දකුණ | 06-134 |
| නුවර පාර වම | 361-837 |
| නුවර පාර දකුණ | 400 -1042 |
| පුදුමලේ කොළණි පාර වම | 03-37 |
| පුදුමලේ කොළණි පාර දකුණ | 10-46 |
| පුදුමලේ ලවර් පාර වම | 05-68 |
| පුදුමලේ ලවර් පාර දකුණ | 02-66 |
| රත්වත්ත පාර වම | 01-33/24 |
| රත්වත්ත පාර දකුණ | 04/36 |
| රිල්හේන කොළණි පාර වම | 05-63 |
| රිල්හේන කොළණි පාර දකුණ | 04-86 |
| උඩෝවිට පාර වම | 19-278B |
| උඩොවිට පාර දකුණ | 10-272 |
| **කොට්ඨාස අංක 03** | |
| ගල්වල පාර වම | 113-205 |
| ගල්වල පාර දකුණ | 102-228/06 |
| කඩුගන්නාව පාර දකුණ | 154//110 |
| **කොට්ඨාස අංක 06** | |
| හපුගස්පිටිය පාර වම | 75/02-125 |
| හපුගස්පිටිය පාර දකුණ | 66/132-6 |
| කීරපනේ පාර වම | 52/33A - 52/38 |

| *පාර/වීථිය/මාවත* | *වරිපනම් අංක* |
|---|---|
| **කොට්ඨාස අංක 07** | |
| හාට්ෆීල්ඩ් පාර වම | 05-81/26 |
| හාට්ෆීල්ඩ් පාර දකුණ | 02-120 |
| හෙම්මාතගම පාර වම | 145-173 |
| හෙම්මාතගම පාර දකුණ | 06-156 |
| හපුගස්පිටිය පහළ පාර වම | 3-17 |
| කයිකාට්රි පාර වම | 25-275/02 |
| කයිකාට්රි පාර දකුණ | 04-171/15 |
| ඉහල සිංහාපිටිය පාර වම | 29-121/7 |
| ඉහළ සිංහාපිටිය පාර දකුණ | 48-144 |
| ජයරත්න මාවත වම | 07-95/04 |
| ජයරත්න මාවත දකුණ | 06-136 |
| අම්බුළුවාව පාර වම | 97-215 |
| අම්බුළුවාව පාර දකුණ | 162-344 |
| රත්මල්කඩුව පාර වම | 141-345 |
| රත්මල්කඩුව පාර දකුණ | 160-350 |
| **කොට්ඨාස අංක 12** | |
| අංගම්මන ගම්පොළ වත්ත පාර වම | 11-121 |
| අංගම්මන ගම්පොළ වත්ත පාර දකුණ | 04-138 |
| අංගම්මන කොළණිය පාර වම | 05-241 |
| අංගම්මන කොළණිය පාර දකුණ | 04-200 |
| කාර්මික විද්‍යාල පාර වම | 05-333 |
| කාර්මික විද්‍යාල පාර දකුණ | 04-248 |
| ෆොන්සේකා වත්ත පාර වම | 05-91 |
| ෆොන්සේකා වත්ත පාර දකුණ | 16-88/4 |
| මෛත්‍රී මාවත වම | 35-85/01 |

12-410

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ස්ථාන සම්බන්ධයෙන් වූ විරෝධතා කැඳවීමේ දැන්වීම

කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 91ඩී උණගස්වෙල ග්‍රාම නිලධාරි වසමේ කරන්දෙණිය, පනාපිටිය, අංක 96/ඒ යන ස්ථානය 2026 වර්ෂයට අදාළව ගෝසාතක ස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා එකී ලිපිනයේ පදිංචි එම්. එම්. එම්. හයිරාස් නැමැති අය මා වෙතින් ඉල්ලුම් කර ඇත. එබැවින් එකී ස්ථානයේ ගෝසාතක ව්‍යාපාරයක් හා මාංශ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් දක්වන කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවකු සිටීනම් මෙම නිවේදනය ප්‍රකාශයට පත් වූ දින සිට දින 14 ක් ඇතුළත එකී විරෝධතාවයට හේතුවන කරුණු ඇතුළත් ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුතුව ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා වෙත් ලැබීමට සලස්වන මෙන් 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 වැනි වගන්තිය ද සමග කියවිය යුතු ගෝ ඝාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

ආර්. එච්. සමන් කුමාර රණසිංහ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

12-662

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ආඥාපනත (272 අධිකාරය) යටතේ එළගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන්
විරෝධතා කැඳවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2025 නොවැම්බර් මස 18 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-02 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රවිඳු උස්වැටකෙයියාව,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

2025 නොවැම්බර් මස 18 දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

2026 වර්ෂයට මැදදුම්බර ප්‍රාදේශීය සභාව සතු එළගවමස් වෙළඳසැල පවත්වාගෙන යාම සඳහා ගෝසාතක ආඥාපනත (272 අධිකාරිය) 7(1) වගන්තිය යටතේ විරෝධතා කැඳවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසාද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

12-535/1

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ආඥාපනත (272 අධිකාරය) යටතේ එළගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන්
විරෝධතා කැඳවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2025 නොවැම්බර් මස 18 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-05 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රවිඳු උස්වැටකෙයියාව,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

2025 නොවැම්බර් මස 18 වන දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයේ 2026 වර්ෂයට එළ ගවමස් වෙළඳසැල පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ලබා ගැනීමට ඉදිරිපත්ව සිටින බව ගෝසාතක ආඥාපනත 272 අධිකාරිය 7(1) වගන්තිය යටතේ විරෝධතා කැඳවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසාද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරු වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළඳාම කරගෙන යාම සඳහා 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළඳ සැල පිහිටි ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එම්. එෆ්. අහමද් සිරාජ් | අංක 70/A, අඹගහලන්ද, තෙල්දෙණිය | මස් පිණිස එළ ගව මස් වෙළඳ සැල |

12-535/2

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ආඥාපනත (272 අධිකාරය) යටතේ ගෝසාතකාගාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන්
විරෝධතා කැඳවීම

මැදදුම්බර ප්‍රාදේශීය සභාව විසින් 2025 නොවැම්බර් මස 18 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ-05 යටතේ පහත දැක්වෙන තීරණය ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රවිඳු උස්වැටකෙයියාව,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව,
තෙල්දෙණිය.

2025 නොවැම්බර් මස 18 දින,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයේ 2026 වර්ෂයට ගෝඝාතකාගාරය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ලබාගැනීමට ඉදිරිපත් ව සිටින බව ගෝඝාතක ආඥාපනත 272 අධිකාරිය 7(1) වගන්තිය යටතේ විරෝධතා කැඳවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳ මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසාද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරු වෙත ගෝ ඝාතකාගාරය කරගෙන යාම සඳහා 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *ගෝඝාතකාගාරය පිහිටි ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එම්. එෆ්. අහමද් සිරාජ් | අංක 244, අඹගහලන්ද, තෙල්දෙණිය | මස් පිණිස එළ හරක් ඝාතනය |

12-535/3

---

**පලාගල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය සමග කියවිය යුතුය. පලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2023 මැයි මස 15 දින පැවති ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු රැස්වීමේ තීරණ අංක පිපිඑස්/2023/05/15/60 යටතේ මම තීරණය කරමි.

ජී. කරුණාරත්න බංඩාර,
සභාපති,
පලාගල ප්‍රාදේශීය සභාව.

2025 ජුලි මස 09 දින,
පලාගල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තිය යටතේ පලාගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකම සඳහා 2024 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂයේ තක්සේරු වටිනාකම ලෙස පිළිගැනීමට,

134 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් තුළ පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට පහක් (5%) ක වරිපනම් බද්ද පනවා අය කිරීමට; සහ

134(6) වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂය සඳහා පනවන ලද එම වරිපනම් බද්ද 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2026 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම බදු මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, එසේ *නැතහොත්* වරිපනම් බදු මුදල එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

12-465

---

**බළන්ගොඩ නගර සභාව**

ගෝඝාතක ආඥාපනත යටතේ නිවේදනයයි

මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයේ ගෝ ඝාතක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රය නිකුත් කිරීම සඳහා බළන්ගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් එසේ විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින දාහතර (14) ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 අධිකාරය 1893 අංක 09 දරන ගෝ ඝාතක ආඥාපනතේ 7 වගන්තියේ (2) යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. පේමදාස,
සභාපති,
බලංගොඩ නගර සභාව.

2025 දෙසැම්බර් මස 17 දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගෝ ඝාතකාගාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාල සීමාව* |
|---|---|---|---|
| 01 | ෆලීල් මොහොමඩ් රවුෂාන්, අංක 381, කහටපිටිය පාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | බළන්ගොඩ කහටපිටිය පාර, වරිපනම් අංක 45 දරන ස්ථානය | 2026.01.01 සිට 2026.12.31 දක්වා |

12-609/1

---

**බළන්ගොඩ නගර සභාව**

ගෝ ඝාතක ආඥාපනත යටතේ නිවේදනයයි

මෙහි පහත සඳහන් උපලේඛනයන්හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන්හි මාංශ වෙළඳාම කරගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා බළන්ගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින දාහතර (14) ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 272 අධිකාරය 1893 අංක 09 දරන ගෝ ඝාතක ආඥාපනතේ 7 වගන්තියේ (2) යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජී. පේමදාස,
සභාපති,
බලංගොඩ නගර සභාව.

2025 දෙසැම්බර් මස 17 දින,
බලංගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *වෙළඳාම් කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01 | අබ්දුල් මුන්තාලිෆ් මොහොමඩ් රෙම්ෂීන් අංක 443/1, දෙහිගස්තලාව, බළන්ගොඩ. | පොදු වෙළඳසැල අංක 15 දරන එළුමස් කඩ කාමරය | එළු මස් අලෙවිය |
| 02 | ෆලීල් මොහොමඩ් රවුෂාන්, අංක 381, කල්තොට පාර, මිරිස්වත්ත, බළන්ගොඩ. | පොදු වෙළඳසැල අංක 16 දරන ගවමස් කඩ කාමරය | ගවමස් අලෙවිය |

12-609/2

---

**මහනුවර මහා නගර සභාව**

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මහනුවර මහා නගර සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 02 දින අංක 8/38 දරන සභා සම්මුතිය අනුව පහත දැක්වෙන යෝජනාව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් මහනුවර මහා නගර සභාවට ගෙවිය යුතුය. එසේ නියමිත දිනට වරිපනම් බදු මුදල් නොගෙවන සියළුම දේපළ සඳහා මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය ප්‍රකාර ගෘහස්ත දේපළක් සඳහා 15% ක වරෙන්තු ගාස්තුවක් ද,. ගෘහස්ත නොවන දේපළක් සඳහා 20% ක වරෙන්තු ගාස්තුවක් ද අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2026 වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර මහනුවර මහා නගර සභාව වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් වන දින හෝ එදිනට මත්තෙන් මහනුවර මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ..

චන්ද්‍රසිරි විජේනායක,<br>
නගරාධිපති,<br>
මහනුවර මහා නගර සභාව.

2025 දෙසැම්බර් මස 03 දින,<br>
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

252 අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වගන්තියේ (1) උපවගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිශ්චල නිවාසවල, ගොඩනැගිලිවල, තනාගෙන යනු ලබන ගොඩනැගිලිවල ඉඩම්වල හා ගෙපත්වල 2026 වර්ෂයේ දී නව වාර්ෂික තක්සේරු වටිනාකම් අනුව අය කිරීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික වටිනාකමින්,

*(අ)* නේවාසික ස්ථාන මත සියයට දහ හතරක (14%) ක වරිපනම් බද්දක් ද,
*(ආ)* ඉඩම්, පුරන් කුඹුරු හා වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන, තනාගෙන යන ගොඩනැගිලි මත සියයට විසි එක (21%) ක වරිපනම් බද්දක් ද 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,
*(ඇ)* අස්වද්දන ලද කුඹුරු වරිපනම් බදු වලින් නිදහස් කිරීමටත්,

ඒ වරිපනම්, එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් මහනුවර මහා නගර සභාව යෝජනා කරන්නීය.

12-492/1

---

**මහනුවර මහා නගර සභාව**

2026 වර්ෂයේ තක්සේරු ලේඛන පරීක්ෂා කිරීම

2026 වර්ෂය සඳහා වූ තක්සේරු ලේඛන දැනට සූදානම් ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 235(1) වගන්තිය ප්‍රකාර මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. පී. චන්ද්‍රසිරි විජේනායක,
නගරාධිපති,
මහනුවර මහා නගර සභාව.

2025 දෙසැම්බර් මස 03 දින,
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

12-492/2

---

**අක්කරපත්තුව මහ නගර සභාව**

යෝජිත අයවැය - 2026

මහා නගර සභා ආඥාපනතේ 252 පරිච්ඡේදයේ 212(ආ) වගන්තිය ප්‍රකාරව, අක්කරපත්තුව මහා නගර සභාව සඳහා ඇස්තමේන්තු කරන ලද 2026 මූල්‍ය වර්ෂය සඳහා වන ආදායම් සහ වියදම් විස්තර ඇතුළත් වැඩ සටහන් අයවැය, 2025.12.09 දින සිට දින හතක් (07) පුරාවට මහජනතාවගේ පරීක්ෂාව සඳහා අක්කරපත්තුව මහා නගර සභා කාර්යාලයේ තබා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එල්. එම්. අතාවුල්ලා,
නගරාධිපති.

2025 දෙසැම්බර් මස 02 දින,
මහ නගර සභා කාර්යාලය,
අක්කරපත්තුව.

12-559

---

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

වරිපනම් තක්සේරු පොත ප්‍රදර්ශනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ දැක්වෙන නියමයන් යටතේ පාතහේවාහැට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති සියලු නිශ්චල දේපළවල සහ එක් එක් පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල අලුත් වාර්ෂික වටිනාකම් ඇතුළත් කර ඇති තක්සේරු පොත, පහත සඳහන් ස්ථානයේ නිශ්චිතව දක්වා ඇති කාලයන් ඇතුළත, ගාස්තු අය කිරීමකින් තොරව මහජනතාවගේ පරීක්ෂා කිරීම සඳහා ප්‍රදර්ශනයට තබා තිබෙන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. එක් එක් දේපළ හිමියා වෙත නිකුත් කරනු ලබන තක්සේරු නිවේදනය තමන් වෙත ලැබුණු දින සිට දින තිහක් ගත වීමට පෙර එකී වාර්ෂික තක්සේරුව පිළිබඳ, කිසියම් විරෝධතාවක් වේ නම්, සභාපති පාතහේවාහැට ප්‍රාදේශීය සභාව, තලාතුඔය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ එකී කාලය ඇතුළත සතියේ වැඩ කරන දිනවල **පෙරවරු 08.30 සිට පස්වරු 04.00** දක්වා අතර කාලය තුළ අතින්

ගෙනවිත් භාර දිය හැකි බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ. නියමිත කාලයෙන් පසුව ලැබෙන කිසියම් විරෝධතාවක් වේ නම්, ඒ විරෝධතා සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තක්සේරු පොතෙහි කිසියම් වාර්ෂික තක්සේරුවක් පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඒ වාර්ෂික තක්සේරුව අදාළ වන දේපළෙහි අයිතිකරුට හෝ එහි නීත්‍යානුකූල පදිංචිකරුට පමණක් බව විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ. මේ නිසා තක්සේරු පොත පරීක්ෂා කිරීමට පැමිණෙන තැනැත්තා ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම අනිවාර්යය බව සළකන්න.

තක්සේරු පොත ප්‍රදර්ශනය කරන ස්ථානයේ ලිපිනය :

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව,<br>ගුරුදෙණිය පාර,<br>තලාතුඔය.

තක්සේරු පොත පරීක්ෂා කළ හැකි දින හා වේලාවන්

*ගැසට්* පත්‍රය පළ වූ දින සිට 2026.01.31 දින දක්වා,<br>සතියේ වැඩ කරන දිනවල පෙරවරු 08.30 සිට පස්වරු 04.00 දක්වා

ආර්. එම්. කේ. එස්. බී. රාජනායක,<br>සභාපති,<br>පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

12-474

---

**හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2025.11.21 දිනැති අංක 2464 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රසිද්ධ කිරීමට යෙදුණ පහත මාර්ගය සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමට පනවා තිබූ කාල සීමාව තුළ කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් වී නොමැති හෙයින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *ග්‍රාම සේවා වසම* | *ආරම්භය* | *අවසානය* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|
| 01 | ඇඹුල්පුර කොස්හින්නා ගොඩ මාර්ගය (සාම මාවත) | 453 ඇඹුල්පුර ග්‍රාම නිලධාරි වසම | දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති පාර | කාන්ති දොඩම්තැන්න මහත්මියගේ නිවස | 181.5 මීටර් | අඩි 10 |

*දකුණු පස :*

1. ඊ. ජී. එස්. වර්ණතිලක මයා - අංක 135/4, ඇඹුල්පුර, නුගවෙල
2. ඩී. ජී. කාන්ති මිය - අංක 135/43/ඩී, ඇඹුල්පුර, නුගවෙල
3. ඩී. ජී. රෝහණ කුමාර මයා - අංක 185, ඇඹුල්පුර, නුගවෙල

*වම් පස :*

1. ජී. ජී. ජී. ජී. ජයවීර මිය - අංක 144/7, ඇඹුල්පුර, නුගවෙල
2. ඊ. ජී. එම්. ආර්. වර්ණතිලක මයා - 135/3, ඇඹුල්පුර, නුගවෙල
3. පී. ජී. අයි. කේ. විජේවික්‍රම මයා - අංක 35/6, ඇඹුල්පුර, නුගවෙල
4. කේ. ඒ. ජී. ජේ. රෝහණ මයා - අංක 135/3/ඒ, යොහාන් නිවස, ඇඹුල්පුර, නුගවෙල
5. එස්. ආර්. එස්. එස්. බණ්ඩාර මයා - අංක 135/3/බී, ඇඹුල්පුර, නුගවෙල

පිඹුරුපත - මිනින්දෝරු සී. එස්. ලියනගේ මයා විසින් මැන අඳින ලද අංක 3285 දරන පිඹුරුපත

ආර්. ඒ. එස්. ඉඳුනිල් කරුණාරත්න,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

12-556

---

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර දී ඇති කාලයක් වශයෙන් 2025.07.18 දින සිට 2028.07.18 දක්වා කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වන වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව මෙම පහත උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාංමාවත්/පාරවල් වශයෙන් සැලකීම සඳහා 2025.10.14 දින පැවති මහ සභා තීරණ අංක 5.5.1 යටතේ යෝජනා සම්මත කර ඇති හෙයින් ඊට විරෝධතා ඇත්තේ නම් ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

නලීන් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | පොල්ගස් දෙණිය මාර්ගය | අරඹේගම නැගෙනහිර | ඉඹුල්මල් ගම නාගොල්ල මාර්ගය | එම්. ජී. ජී. ඒ. විජේතුංග මහතාගේ නිවස අසල | 1. එම්. ජී. සිරිසේන මයා<br>2. එම්. ජී. සිතාර දුල්ෂාන් මයා<br>3. එම්. ජී. සුනිල් විජේතුංග මයා<br>4. පී. ජී. සෙනෙහෙ ලතා මිය<br>5. එම්. ජී ලක්ෂ්මන් විජේතුංග මයා | 1. එම්. ජී. සිරිසේන මයා<br>2. එම්. ජී. සුනිල් විජේතුංග මයා<br>3. පී. ජී. සෙනෙහලතා මිය<br>4. එම්. ජී. ලක්ෂ්මන් විජේතුංග මයා | මීටර් 120 | මීටර් 3.28 | 4853 |

12-469

## මීගමුව මහා නගර සභාව

මහා නගර සභා සීමාව තුළ මස් වෙළඳසැල් වසා තැබිය යුතු දින ප්‍රකාශයට පත්කිරීම

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ (272) අධිකාරී 17 දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිසි බලධාරියා වශයෙන් මීගමුව මහා නගර සභාව වෙනුවෙන් නගරාධිපති හීන්කෙන්ද මුදලිගේ දොන් රොබට් හීන්කෙන්ද වන මම 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් දිනයන් හා පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් ඉදිරියේ දී අවස්ථාවෝචිත ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි දිනයන්හි දී ද මීගමුව නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, මස් වෙළඳාම් කිරීම හා මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන් තහනම් බව දන්වා සිටිමි.

එච්. එම්. ඩී. රොබට් හීන්කෙන්ද,
නගරාධිපති,
මීගමුව මහා නගර සභාව,
මීගමුව.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 2026.01.03 | සෙනසුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2026.02.01 | ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.02.04 | බදාදා | නිදහස් සමරු දිනය |
| 2026.03.02 | සඳුදා | මැදින්පුර පසළොස්වක පෝය දිනය |
| 2026.04.01 | බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.05.01 | සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.05.02 | සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 2026.05.30 | සෙනසුරාදා | අධි පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.06.29 | සඳුදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.07.29 | බදාදා | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 2026.08.27 | බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2026.09.26 | සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2026.10.04 | ඉරිදා | ලෝක සත්ත්ව දිනය |
| 2026.10.25 | ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.11.24 | අඟහරුවාදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2026.12.23 | බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

12-536

**මීගමුව මහා නගර සභාව**

ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරිය යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි ගව/එළු/ඌරු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවලුන් විරුද්ධ වන්නේ නම්. ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන ද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දා සිට, දින 14 ක් තුළ ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරිය 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්.එම්.ඩී. රොබට් හීන්කෙන්ද,
නගරාධිපති,
මහා නගර සභාව,
මීගමුව.

2025 දෙසැම්බර් මස 15 දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***මීගමුව බල ප්‍රදේශයට අයත් ගව මස් කඩ***

| *අනු අංකය* | *මස් කඩ අයිතිකරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය* | *මස් කඩය පිහිටි ප්‍රදේශය* | *මස් කඩය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය* | *පෞද්ගලික ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | කේ. ආර්. එම්. රිස්වි මයා 198236500604 | ශාන්ත ජෝශප් වීදිය ගව මස් කඩය | අංක 72/27, ශාන්ත ජෝශප් වීදිය ගව මස් කඩය | අංක 61/8B, ජය මාවත, පල්ලන්සේන, කොච්චිකඩේ. |
| 02. | එන්. එම්.ෆයිසාන් මයා 950430796V | දීන් හන්දිය ගව මස් කඩය | අංක187, ශාන්ත ලාසරස් පාර, මීගමුව. | G.W.39, ජයරත්න පාර, මීගමුව. |
| 03. | එම්.එස්.එම්.රියාස් මයා 712070323V | පෙරියමුල්ල ගව මස් කඩය | අංක 314, පල්ලිය පාර, පෙරියමුල්ල,මීගමුව. | අංක 12, රෂීඩ් ෆරීඩ් මාවත, පෙරියමුල්ල, මීගමුව. |
| 04. | ඒ. එස්. එම්. සුහයිබාල් මයා 520181687V | පෙරියමුල්ල මහා පල්ලිය ගව මස් කඩය | අංක 51A, යොන් වීදිය, පෙරියමුල්ල,මීගමුව. | අංක 46, සෝන්ඩර්ස් පාර,මීගමුව. |
| 05. | එම්. ඉසෙඩ්. එම්. රිජාස් මයා 923044027V | සහීඩ් මරික්කාර් මාවත ගව මස් කඩය | අංක 63/35, සහීඩ් මරික්කාර් මාවත, පෙරියමුල්ල, මීගමුව. | අංක 63/35, සහීඩ් මරික්කාර් මාවත, පෙරියමුල්ල, මීගමුව. |
| 06. | එම්. එෆ්. එම්. ෆිර්දවුස් මයා 198023310017 | ෆයෙඩ් ෆාම් ෂොප් | අංක 79A, මීරිගම පාර, මීගමුව. | අංක 79A, මීරිගම පාර, මීගමුව. |
| 07. | එම්. එෆ්. එම්.ශිහාන් මයා 832300136V | | අංක 42, මුර් පාර, පෙරියමුල්ල. | අංක 18/12, රහුමානාබාත් පෙරියමුල්ල. |

*මීගමුව බල ප්‍රදේශයට අයත් ඌරු මස් කඩ*

| *අනු අංකය* | *මස් කඩ අයිතිකරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය* | *මස් කඩය පිහිටි ප්‍රදේශය* | *මස් කඩය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය* | *පෞද්ගලික ලිපිනය* |
|---|---|---|---|---|
| 08. | ඩබ්ලිව්.ආර්.ඒ.ෆොන්සේකා මයා 460311357V | | අංක 112/10B, ඇඩ්නිවස් පාර, පෙරියමුල්ල, මීගමුව. | අංක 112/10A, ඇඩ්නිවස් පාර, පෙරියමුල්ල,මීගමුව. |
| 09. | ආර්.එම්.ජගත් මිල්රෝයි ෆොන්සේකා මයා 770084407 V | | මුන්නක්කරය පාලම අසල. | අංක 526 A, ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන. |
| 10. | එම්.ඒ.එන්.පින්තු මයා 945873905 V | | අංක 02B, ලෙයිටන් පටු මග, මීගමුව. | අංක 447, සෙන්වරි ගාර්ඩන්,කට්ටුව, මීගමුව. |
| 11 | ආර්.ඒ.නෙරංජන් දිෂාන් මයා 952952820 V | | අංක 14A, ශාන්ත මාටින් පාර, මුන්නක්කරය, මීගමුව. | අංක 525/1, ලියෝ මාවත, කෝන්ගොඩමුල්ල, කටාන. |
| 12. | කේ. අජිත් සුසන්ත මයා 720773457 V | | අංක 136, වික්‍රම රාජසිංහ පාර, කුරණ, මීගමුව. | අංක 554/27, දෙවන කුරණ, කොළඹ පාර මීගමුව. |
| 13. | සංජනා කැරන් මිය 855642549 V | | අංක 647, කොළඹ පාර, කුරණ, මීගමුව. | අංක 11/16, ජූඩ්මාවත, කුරණ, මීගමුව. |

*මීගමුව බල ප්‍රදේශයට අයත් එළු මස් කඩ*

| | | | | |
|---|---|---|---|---|
| 14. | එම්. එෆ්. එම්.පිර්දවුස් මයා 198023310017V | | අංක 79A, මීරිගම පාර, මීගමුව. | අංක 79A, මීරිගම පාර, මීගමුව. |
| 15. | එම්. එස්. එම්.පසාල් මයා 702643481V | | අංක 314/B, පෙරියමුල්ල, මීගමුව. | අංක 23C 11, ජුම්මා මස්ජිඩ් මාවත, පෙරියමුල්ල, මීගමුව. |

*කොච්චිකඩේ බල ප්‍රදේශයට අයත් ගව මස් කඩ*

| | | | | |
|---|---|---|---|---|
| 16. | ඒ. ෂෙහාන් අකලංක පෙරේරා මයා 962402240 V | දළුපත ගව මස් කඩය | අංක 280/1, හලාවත පාර, මීගමුව. | අංක 170, සුමිතුරු මාවත, දළුපත, මීගමුව. |
| 17. | ඒ.ඒ.එම්.සර්හාන් මයා 711191216 V | දකුණු පල්ලන්සේන ගව මස් කඩය | අංක 69, තක්කියා පාර, පෝරුතොට,කොච්චිකඩේ. | අංක 16/3A, පෝරුතොට පාර, කොච්චිකඩේ. |
| 18. | එම්.පී.අයි.එම්.ෂියාම් මයා 772694113 V | කම්මල්තුරය ගව මස් කඩය | අංක 241/F, පෝරුතොට, කොච්චිකඩේ. | අංක 52C, තක්කියා පාර, පෝරුතොට, කොච්චිකඩේ. |

| අනු අංකය | මස් කඩ අයිතිකරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය | මස් කඩය පිහිටි ප්‍රදේශය | මස් කඩය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය | පෞද්ගලික ලිපිනය |
|---|---|---|---|---|
| 19. | බී. වර්ජිනියා ජුඩිත් ස්මයිල් අල්මේදා මිය. 725252420 V | කට්ටුව ගව මස් කඩය | අංක 221/B , හලාවත පාර කට්ටුව, මීගමුව. | අංක 221/B, හලාවත පාර කට්ටුව, මීගමුව. |
| 20. | එම්. අලි මයා 742931625 V | | අංක 476/E, තක්කියාපාර, දළුවකොටුව,කොච්චිකඩේ. | අංක 476/E, තක්කියාපාර, දළුවකොටුව, කොච්චිකඩේ. |
| 21. | එන්. එම්. එන්. හුසේන් මයා 970282599 V | | අංක 178/A, පෝරුතොට, කොච්චිකඩේ. | අංක 80/6, තක්කියා පාර, පෝරුතොට, කොච්චිකඩේ. |
| 22. | එම්. එෆ්. එම්. පිර්දවුස් මයා 198023310017 | ෆයෙඩ් ෆාම් ෂොප් | අංක 4/1, තක්කියා පාර, පෝරුතොට, කොච්චිකඩේ. | අංක 79/A, මීරිගම පාර, මීගමුව. |

*කොච්චිකඩේ බල ප්‍රදේශයට අයත් ඌරු මස් කඩ*

| | | | | |
|---|---|---|---|---|
| 23. | ඒ. ෂෙහාන් අකලංක පෙරේරා මයා 962402240 V | | අංක 280/1, හලාවත පාර,මීගමුව. | අංක 170, සුමිතුරු මාවත, දළුපත, කොච්චිකඩේ. |
| 24. | පී.වර්ජිනියා ජුඩිත් ස්මයිල් අල්මේදා මිය. 725252420 V | | අංක 34, ඒත්තුකාල, මීගමුව. | අංක 221/B, හලාවත පාර, කට්ටුව, මීගමුව. |
| 25. | එම්.එම්.රංජනී ප්‍රේමලතා පාර්ස් මිය 60764223 V | | අංක 101, දළුවාකොටුව, කොච්චිකඩේ. | අංක 21/11, ශ්‍රමදාන මාවත, ඒත්තුකාල, මීගමුව. |

*කොච්චිකඩේ බල ප්‍රදේශයට අයත් එළු මස් කඩ*

| | | | | |
|---|---|---|---|---|
| 26. | එම්. ෆාසි මයා 196400602550 | | අංක 317/B, පෝරුතොට, කොච්චිකඩේ. | අංක 318, පෝරුතොට, කොච්චිකඩේ. |
| 27. | එම්. ඒ.එම්.සෆ්රාස් මයා 198829601885 | | අංක 243/A, පෝරුතොට,කොච්චිකඩේ | අංක 217/4/F, පෝරුතොට, කොච්චිකඩේ. |

*තලාහේන බල ප්‍රදේශයට අයත් ගව මස් කඩ*

| *අනු අංකය* | *මස් කඩ අයිතිකරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය* | *මස් කඩය පිහිටි ප්‍රදේශය* | *මස් කඩය පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය* | *පෞද්ගලික ලිපිනය* |
|---|---|---|---|---|
| 28. | එම්.යූ.උම්මුකයිරියා මිය 617640643 V | පිටිපන ලෙල්ලම අසල ගව මස් කඩය | පිටිපන මීසම එක්සත් ධීවර සමිතිය - අංක 87/A, කඩ කාමරය, පිටිපන, මීගමුව. | අංක 148/16 A, ශාන්ත ලාසරස් පාර, පෙරියමුල්ල, මීගමුව. |
| 29. | ඩී.දිනේෂ් විදුරංග මයා 820984234 V | අලුත්කුරුව ගව මස් කඩය | අංක 857, දකුණු පිටිපන, මීගමුව. | අංක 857, දකුණු පිටිපන, මීගමුව. |
| 30. | එම්.ආර්.එම්.ඔස්මන් මයා. 761813935 V | දූව හන්දිය ගව මස් කඩය | අංක 572/2/A, උතුරු පිටිපන, මීගමුව. | අංක 24/4, හියුගෝ මාවත,මීගමුව. |

*තලාහේන බල ප්‍රදේශයට අයත් ඌරු මස් කඩ*

| | | | | |
|---|---|---|---|---|
| 31. | ඩී. දිනේෂ් විදුරංග මයා 820984234 V | | අංක 857, දකුණු පිටිපන, මීගමුව. | අංක 857, දකුණු පිටිපන, මීගමුව. |
| 32. | ඩබ්ලිව්. එස්. කේ. මනෝරි ප්‍රනාන්දු මිය 777902326 V | | අංක 159/1/A, උතුරු පිටිපන, මීගමුව. | අංක 159/1/A, උතුරු පිටිපන, මීගමුව. |

12-622

---

**හක්මණ ප්‍රාදේශීය සභාව**

ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාර හක්මණ ප්‍රාදේශීය සභාව විසින් 2025.10.14 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 05 : 06 යටතේ පහත දැක්වෙන ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමේ යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. ඩබ්. සෙනෙවිරත්න,<br>සභාපති,<br>හක්මණ ප්‍රාදේශීය සභාව.

**ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමේ යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ බලතල ප්‍රකාරව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) *ගැසට් පත්‍රයේ* 2013.05.17 දින අංක 1811 දරන නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අතුරු ව්‍යවස්ථා මාලාවේ XXV කොටස ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 සහ 126 වගන්ති වලින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව හක්මණ ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස පිළිගැනීමටත්, එකී අතුරු ව්‍යවස්ථාව 2026.01.01. දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

12-582

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(5) වගන්තිය යටතේ කරන නිවේදනයයි

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2022 ජනවාරි මස 24 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "සබරගමුව පළාතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 2025 ජූලි මස 18 දින හා අංක 2,446 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබූ නිවේදනයේ ඇතුළත් උපලේඛනයේ ඇතුළත් මාර්ගය මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සැලකීමට විරුද්ධව පැමිණිලි ලැබී නොමැති හෙයින් සහ එකී නිවේදනයෙන් නියම කර ඇති දිනට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා නොමැති බැවින් ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සලකනු බවට තහවුරු කරන ලද මෙම මාර්ගය ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට 2023.03.14 දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 14 යටතේ සම්මත කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී මාර්ගය මෙහි උපලේඛනයේ දක්වා ඇති අතර, එහි සඳහන් මෙම මාර්ගය ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තියේ (5) උපවගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති මාර්ගයක් ලෙස සලකනු ලැබිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

පුතුල උඩගම,
සභාපති,
ප්‍රාදේශීය සභාව මාවනැල්ල.


2025 නොවැම්බර් මස 26 දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| | | |
|---|---|---|
| පාරේ නම | - | වදුරාගොඩ වත්ත පාර |
| පාරේ දිග | - | 102.88 LM |
| පාරේ පළල | - | 3.05 LM |
| පාරේ ආරම්භය සිට අවසානය දක්වා | - | නාංකුරුගම පාරේ සිට ඒ. ඩබ්ලිව්. ඉන්ද්‍රාවතී යන අයගේ ඉඩම දක්වා |
| ග්‍රාම නිලධාරි වසම | - | 31B නාංකුරුගම වසම |
| මිනින්දෝරු මහතාගේ නම | - | එම්. කේ. එස්. එම්. එම්. දිසානායක |
| ඉඩමේ සැලැස්මේ අංකය සහ දිනය | - | 1992/2022.08.20 |

| *අනුක්‍රමික අංකය* | *වම්පස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01 | ඒ. ඩබ්ලිව්. තිලකරත්න | වදුරාගොඩ වත්ත |
| 02 | ඒ. ඩබ්ලිව්. සේනාරත්න | වදුරාගොඩ වත්ත |
| 03 | ඒ. ඩබ්ලිව්. සිරියාවතී | වදුරාගොඩ වත්ත |
| 04 | ඒ. ඩබ්ලිව්. චන්ද්‍රාවතී | වදුරාගොඩ වත්ත |

| *අනුක්‍රමික අංකය* | *දකුණුපස ඉඩම් හිමියාගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 01 | ඒ. ඩබ්ලිව්. ආරියරත්න | වදුරාගොඩ වත්ත |
| 02 | ඒ. ඩබ්ලිව්. අනුලාවතී | වදුරාගොඩ වත්ත |
| 03 | ඒ. ඩබ්ලිව්. ඉන්ද්‍රාවතී | වදුරාගොඩ වත්ත |


Dissanayaka M.K.S.M.M
Registered Licensed Surveyor
(Regd. No.20041057)
Gelioya
Plan No:1992
Reservation For Cemetry
Land Of A.W.Indrawathie
Land Of A.W.Chandrawathie
4 Wide Access
Land Of A.W.Siriyawathie
Land Of A.W.Anulawathie
124.52 Feet
10 Wide Access
35.82 Feet
Land Of A.W.Senaratne
1
Land Of A.W.Ariyaratne
Land Of A.W.Thilakaratne
From Main Road
Road
177.10 Feet
Balance Portion Of
Same Land
Premaratne
Wire Fence
To Nankurugama
Scale 1:500
-PLAN-
AN ALLOTTMENT OF THE LAND CALLED
WADURAGODA HENA
BEING RESURVEY OF LOT NO.10 IN PLAN NO.4277
MADE BY M.R.SENEVIRATNE L/S
SITUATED AT THE NANKURUGAMA VILLAGE IN
MEDA PATHTHUWA OF GALBODA KORALE
OF
AN ALLOTMENTS OF LAND CALLED
From Mahakumbura To Wanduragoda Watte Road
(The Road Proposed for Concrete)
SITUATED AT THE NAMELA VILLAGE IN
GANNAWAYA PATHTHU OF GALBODA KORALE
KEGALLA DISTRICT, SABARAGAMUWA PROVINCE
Surveyed On : 20 August 2022
CONTAINING IN EXTENT
LOT NO | A. | R. | P | HECTARE | Sq. Feet
1 | 0 | 0 | 17.00 | 0.0430 | 4628.25
Bounded as Described above
Dissanayaka M.K.S.M.M.
Registered Licensed Surveyor
M.K.S.M.M. Dissanayake
Registered Licensed Surveyor

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා මාංශ අලෙවිසැල් සහ ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන් වූ බලපත්‍ර නිකුත් කිරීමට අදාළව 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 7(2) උපවගන්තිය යටතේ විරෝධතා කැඳවීමයි

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් ඉල්ලුම්කරුවන් විසින් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුරූපීව සඳහන් ලිපිනය ඇති ස්ථානයෙහි එහි විස්තර කර ඇති ස්වභාවයේ මාංශ වෙළෙඳ සහ ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව නිවේදනය කරමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයකු විරුද්ධ වන්නේ නම් ඒ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝඝාතක ආඥාපනතේ 7(2) උපවගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. එස්. එස්. බී. රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 05 දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළෙඳ ස්ථානයේ නම* | *වෙළෙඳාමේ ස්වභාවය* |
|---|---|---|
| එම්. ආර්. එම්. රුසාන් | 46A , වහව, රඹුක්කන | ගවමස් අලෙවිය |
| එම්. කේ. එම්. ඉෂාම් | අංක 09, කෑගල්ල පාර, රඹුක්කන | ගවමස් අලෙවිය |
| ඒ. එච්. ඒ. නසාර් | ලබුකොටුව, හුරීමලුව, රඹුක්කන | ගවමස් සහ එළු මස් අලෙවිය |
| ඊ. ආර්. පී. එදිරිසිංහ | කේමින් සුපර්, පිටවෙල, හේවාදිවෙල | ඌරුමස් අලෙවිය |
| ආර්. සී. එන්. අබේවික්‍රම | සිරි නිවස, කුඩාගම, දොඹේමඩ | ඌරුමස් අලෙවිය ගෝඝාතකාගාරය |

12-599

# විවිධ දැන්වීම්

## මහනුවර මහා නගර සභාව

### කුණු රොඩු ගාස්තු සංශෝධනය කිරීම ප්‍රකාශයට පත් කිරීම

මහා නගර සභා ආඥාපනතේ 272 වන ඡේදයේ බලතල ප්‍රකාරව මහනුවර මහා නගර සභාව විසින් වර්ෂ 2002.08.09 දින ප්‍රකාශයට පත් කර ඇති අංක 1249 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV වන කොටසේ පීඩා වැලැක්වීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා යටතේ කරනු ලබන නිවේදනයයි.

වර්ෂ 2013/11/25 වන දින මහනුවර මහා නගර සභාවේ අංක 8(3) දරන සභා සම්මුතිය පරිදි මහා නගර සභා සීමාව තුළ ව්‍යාපාරික ස්ථාන වලින් බැහැර කරනු ලබන කුණු රොඩු සඳහා ගාස්තුවක් අය කිරීමට වර්ෂ 2014/04/11 දිනැති අංක 1858 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV කොටසෙන් ප්‍රකාශයට පත් කල අතර 2014 වර්ෂයේ සිට ඒ අනුව ගාස්තු අය කළ නමුත් එම ගාස්තු සංශෝධනය කිරීමට 2025.11.11 දින අංක 8 (90) දරන සභා තීරණයෙන් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව 2026 වර්ෂයේ සිට පහත පරිදි කුණු රොඩු ගාස්තු සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුණු රොඩු යන්නෙන් අළු දූවිලි අතු ගා දමන ද්‍රව්‍ය කුණු, මල මුත්‍රා, පස්, ගොම හා අපවිත්‍ර ද්‍රව්‍ය කසළ වෙනත් ඉවත දමන ද්‍රව්‍ය අදහස් වේ.

**සංශෝධිත නව කසළ ගාස්තුව**

| *දිනකට ඉවත් කරන කසල ප්‍රමාණය - Kg* | *කසළ ගාස්තුව (රු.) මසකට* |
|---|---|
| 10 - 15 Kg ආයතන සඳහා | 600.00 |
| 15 - 20 Kg ආයතන සඳහා | 800.00 |
| 20 - 30 Kg ආයතන සඳහා | 1,200.00 |
| 30 - 50 Kg ආයතන සඳහා | 2,000.00 |
| 50 - 100 Kg ආයතන සඳහා | 4,000.00 |
| 100 - 150 Kg ආයතන සඳහා | 6,000.00 |
| 150 - 200 Kg ආයතන සඳහා | 8,000.00 |
| 200 - 300 Kg ආයතන සඳහා | 12,000.00 |
| 300 Kg වැඩි ආයතන සඳහා | 15,000.00 |

මෙම ගාස්තු සඳහා රජය විසින් වරින් වර නිවේදනය කරනු ලබන වැට් බද්ද ද ඇතුලත් කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2025 දෙසැම්බර් මස 09 දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

12-458